ජනාධිපති කාර්යාලය
சனாதிபதி அலுவலகம்
PRESIDENTIAL SECRETARIAT

2020 ජූලි මස 01 වන දින
චක්‍රලේඛ අංක : පීඑස්/එස්පී/චක්‍රලේඛ/24/2020

සියළු ආණ්ඩුකාරවරුන්
අමාත්‍යාංශ ලේකම්වරුන්,
දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන්,
සංස්ථා, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
අනෙකුත් අංශ ප්‍රධානීන්

**අතිගරු ජනාධිපතිතුමාගේ ඡායාරූප හා රාජ්‍ය සේවකයින් එළඹෙන මහ මැතිවරණය සඳහා යොදා නොගැනීම**

එළඹෙන මහ මැතිවරණය සඳහා තරඟ කරනු ලබන අපේක්ෂකයන් අතිගරු ජනාධිපතිතුමාගේ ඡායාරූප යොදා ගනිමින්ද, යුධ හමුදා හා රාජ්‍ය නිළධාරින් සම්බන්ධ කර ගනිමින් විවිධ පත්වීම් ලබාදෙන බවට ප්‍රකාශ කරමින්ද මැතිවරණ ප්‍රචාරක කටයුතු සිදුකිරීම පිළිබඳව වාර්තා වී ඇත.

අතිගරු ජනාධිපතිතුමාගේ ඡයාරූප පක්ෂ අපේක්ෂකයින්ගේ ප්‍රචාරක කටයුතු සඳහා යොදා නොගන්නා ලෙසත්, ආරක්ෂක සේවා, රාජ්‍ය සේවා, සංස්ථා, මණ්ඩල හෝ ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන රාජ්‍ය සේවකයන් දේශපාලණ කටයුතු වල නිරත නොවන ලෙසත්, සියළු දෙනාටම මේ පිළිබඳව තරයේ උපදෙස් දෙන ලෙසත් අතිගරු ජනාධිපතිතුමා විසින් මා වෙත නියෝග කර ඇත.

සියළු ආණ්ඩුකාරවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන් හා සංස්ථා, මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන් හා අනෙකුත් අංශ ප්‍රධානීන් මෙම උපදෙස් සිය ආයතනයවල සේවය කරන සියළු රාජ්‍ය සේවකයින් විසින් පිලිපැදීමට වග බලා ගත යුතු බවද දන්වමි.

පී. බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්

පිටපත : සභාපති, මැතිවරණ කොමිෂන් සභාව

ගාලු මුවදොර, කොළඹ 01
காலி முகத்திடல், கொழும்பு 01
දුරකථන / தொலைபேசி ++ 94 (0) 11 2354418
ෆැක්ස් / தொலைநகல் ++ 94 11 2446657
ඊ-තැපැල / மின்-அஞ்சல் prsec@presidentsoffice.lk